# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 1865/45 - 2014 ජුනි මස 07 වැනි සෙනසුරාදා - 2014.06.07

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

## පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනත යටතේ දැන්වීම්

**2013 අංක 30 දරන පළාත් පාලන ආයතනවල**
**පුරප්පාඩු පිරවීමේ (විශේෂ විධිවිධාන) පනතින් සංශෝධිත**
**(262 වන අධිකාරය වූ)**
**පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 65අ(1) වගන්තිය යටතේ**
**වලිකාමම් නැගෙනහිර ප්‍රාදේශීය සභාවේ**
**සභාපති ධූරයේ පුරප්පාඩුවක් පිරවීම**

ඉල්ලා අස්වීම හේතු කොට ගෙන වලිකාමම් නැගෙනහිර ප්‍රාදේශීය සභාවේ සභාපති ධූරය පුරප්පාඩු වී ඇති හෙයින් ද ;

ඉහත කී ආඥාපනතේ 65අ(1) වගන්තිය යටතේ, සභාපති වන අන්නලිංකම් උදයකුමාර් නම් වූ සභාපති අයත් වන්නා වූ ඉලංකෙයි තමිල් අරසු කච්චි නම් වන පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම්ට දින තිහ (30)ක කාල පරිච්ඡේදය ඇතුළත සභාපති වශයෙන් තෝරා පත්කර ගනු ලැබිය යුතු යැයි ප්‍රකාශ කරනු ලැබිය යුතු වූ ද, ඒ පක්ෂයට අයත් වන්නාවූ ද, ඒ වලිකාමම් නැගෙනහිර ප්‍රාදේශීය සභාවේ සභිකයා පිළිබඳව තීරණය කිරීමට මා විසින් නියම කරනු ලැබ ඇති හෙයින් ද ;

ඉහත කී පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම් විසින් ඒ පුරප්පාඩුව පිරවීම සඳහා කනපතිපිල්ලෙයි තුරෛයිසිංකම් මහතා නම් කිරීමේ ස්වකීය තීරණය දන්වනු ලැබ ඇති හෙයින් ද ;

වලිකාමම් නැගෙනහිර ප්‍රාදේශීය සභාවේ තේරීම්භාර නිලධාරී පොන්නතුරෙයි කුගනාදන් වන මම, 2013 අංක 30 දරන පළාත් පාලන ආයතනවල පුරප්පාඩු පිරවීමේ (විශේෂ විධිවිධාන) පනතින් සංශෝධිත (262 වැනි අධිකාරය වූ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 65අ(1) වගන්තිය ප්‍රකාර ක්‍රියා කරමින්, කනපතිපිල්ලෙයි තුරෛයිසිංකම් මහතා වලිකාමම් නැගෙනහිර ප්‍රාදේශීය සභාවේ සභාපති වශයෙන් තෝරා පත් කර ගත් බව මෙයින් දැන් ප්‍රකාශ කරමි.

පී. කුගනාදන්,
තේරීම්භාර නිලධාරී,
වලිකාමම් නැගෙනහිර ප්‍රාදේශීය සභාව.

2014 ජුනි මස 05 වන දින,
දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය,
යාපනය.

06 - 659


1A - G 19687— 75 (2014/06) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

මෙම අති විශේෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.